**ශීර්ෂය 136 - ක්‍රීඩා අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 136 - ක්‍රීඩා අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 නොවැම්බර් 30 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,259.47 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,023.83 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 235.64 ක් හෙවත් සියයට 18.71 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර්31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 457.64 | 400.39 | 57.25 | 12.51 |
| මූලධන | 801.83 | 623.44 | 178.39 | 22.25 |
| **එකතුව** | **1,259.47** | **1,023.83** | **235.64** | **18.71** |

**2.2**

**2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 13601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 12.74 | 9.85 | 6.00 | 9.08 | 58.00 | 17.69 |

**2.3 අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/00/0376/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 3.42 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පතු ගිණුම් 03 ක 2015 දෙසැම්බර් 31 දිනට වූ ශේෂවල එකතුව රු.මිලියන 22.73 ක් විය. විස්තර පහත දැක්වේ.

| **පොදු තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0106/000 | 0.05 |
| 6000/0000/00/0002/0147/000 | 0.01 |
| 6000/0000/00/0016/0093/000 | 22.67 |
| **එකතුව** | **22.73** |

**2.5 විගණන නිරීක්ෂණය**

ක්‍රීඩා අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| (ඈ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (ඉ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (ඊ) | ප්‍රසම්පාදන හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය |

### 3.2 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු. 16,990,779 ක තැන්පතු 05 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 13601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට හිඟහිට තිබුණු එකතුව රු.281,169 ක් වූ ණය ශේෂ වර්ෂ 2ක සිට වර්ෂ 4 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම ණය ශේෂ අයකර ගැනිමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ආ) විශ්‍රාම ගිය නිලධාරියකුගේ රු. 210,821 ක් හා සේවය හැර ගිය නිලධාරීන්ගේ රු.119,015 ක් වශයෙන් එකතුව රු. 329,836 ක හිඟ හිටි ණය ශේෂ වර්ෂ 03 ක සිට වර්ෂ 04 ක් දක්වා කාල පරාසයක් තුළ පැවත එමින් තිබුණත්, එම හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**3.4 යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

**3.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**3.4.2 අභ්‍යන්තර විගණනය**

2009 ජුනි 09 දිනැති DMA/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය පරිදි අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණත්, අභ්‍යන්තර විගණනය විසින් ආවරණය කළ යුතු සමහර විෂය ක්ෂේත්‍ර ප්‍රමාණවත් පරිදි ආවරණය කර නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

අමාත්‍යාංශය සතු වාහන දෙකක් පිළිවෙලින් වර්ෂ 05 ක් හා වර්ෂ 02 ක පමණ කාලයක් ධාවන තත්ත්වයේ නොතිබුණි.

**(ආ) වෙනත් ආයතන සතු වාහන අවිධිමත්ව පරිහරණය කිරීම**

අමාත්‍යාංශ 03 කට දෙපාර්තමේන්තුවකට හා වෙනත් රජයේ කාර්යාලයකට අයත් වාහන 09 ක් විධිමත්ව පවරා නොගෙන අමාත්‍යාංශයේ කටයුතු සඳහා භාවිතා කර තිබුණි.

**(ඇ) පවරා නොගත් දේපළ අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

නෛතිකව පවරා නොගත් නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක රු.9,943,333 ක් වැයකර දියවන්නා ඔය ආශ්‍රිත ඔරු පැදීමේ ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි.

## 3.6 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ පරිදි නීති, රීති හා රෙගුලාසි විධිවිධානයන්ට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 751 | 2014 ඔක්තෝබර් 04 දින රු.12,129,876 ක් වැයකර මිලදී ගෙන තිබූ විදුලි ජනක යන්ත්‍රය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉන්වෙන්ට්‍රියේ ඇතුළත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 880 | රාජ්‍ය නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ ඇප ලබා ගැනිමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 1646 | අමාත්‍යාංශය සතු සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා එළඹෙන මාසයේ 15 වන දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ) අයවැය චක්‍රලේඛය** | |
| 2015 මාර්තු 31 දිනැති අංක 2/2015 දරන අයවැය චක්‍රලේඛයේ 07 ඡේදය හා මුදල් රෙගුලාසි 756(4) | විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර අපහරණය සඳහා සුදුසු වාහන හඳුනා ගෙන නොතිබුණි. |

## 3.7 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති නිමකිරීමේ ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) 2015 වර්ෂයේදී නිමකිරීමට අපේක්ෂා කර තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රු.35,500,000 ක් වූ ව්‍යාපෘති 12 ක් අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර නොතිබුණි.

(ආ) 2014 හා 2015 වර්ෂවලදී ආරම්භ කර තිබූ ව්‍යාපෘතිවලින් ඇස්තමේන්තුගත පිරිවැය රු.77,655,522 ක් වූ ව්‍යාපෘති 05 ක් අමාත්‍යාංශය විසින් අවසන් නොකර අතහැර තිබුණි.

(ඇ) 2017 ආසියානු ක්‍රීඩා උළෙල පැවැත්වීම සඳහා සූරිය වැව ටෙනිස් ක්‍රීඩා පිටියක් ඉදිකිරීමේ කටයුත්ත ශ්‍රී ලංකා නාවික හමුදාවට පවරා තිබුණි. ඒ සඳහා ගිවිසුමකට එළඹ නොතිබුණු අතර ඒ වෙනුවෙන් 2013 හා 2014 වර්ෂවලදී පිළිවෙලින් රු.10,000,000 ක් හා රු.30,000,000 ක් වශයෙන් එකතුව රු.40,000,000 ක් ශ්‍රී ලංකා නාවික හමුදාවට ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එකී කර්මාන්තය ඉටු කර නොතිබුණි. 2015 අප්‍රේල් 23 දිනැති අංක ඩීජීසීඊ/ජීඊඑන්/205/2012 දරන නාවික හමුදාවේ අධ්‍යක්ෂ ජනරාල් (සිවිල් ඉංජිනේරු) ගේ ලිපිය අනුව, ව්‍යාපෘතිය වෙනුවෙන් රු.21,218,937 ක් වැයකර පසුව අතරමඟ නවතා තිබූ බව තහවුරු වීම නිසා වැය කළ මුදල අනාර්ථික වී තිබුණු බව නිරීක්ෂණය විය.

## 3.8 කාර්යසාධනය

කාර්යසාධනය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### 3.8.1 ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධන ව්‍යාපෘති කලින් හඳුනා නොගැනීම හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අදාළ ප්‍රතිපාදන ප්‍රමාද වී ලබාදී තිබීම නිසා 2014 වර්ෂයේ ව්‍යාපෘති ඉටුකිරීම වෙනුවෙන් ලබා දුන් ප්‍රතිපාදනවලින් සියයට 56 ක් ද, 2015 වර්ෂයේ සියයට 27 ක් ද ඉතිරි කර තිබුණි. මේ නිසා අදාළ ව්‍යාපෘති 2015 වර්ෂය අවසන් වන විටත් සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) 2015 අගෝස්තු 12 දිනැති අංක එම්එස්/2/25/8 දරන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියෙන් බටගොල්ල පුස්සදේව, උඩමාදුර විද්‍යාප්‍රදීප, කුරුපනාවල සෙනරත් හා මඩුල්ල ද්විතියික යන පාසල්වල ක්‍රීඩාපිටි සංවර්ධනය සඳහා එකතුව රු.21,243,440 ක ප්‍රතිපාදන සලසා දී තිබුණි. සියලු ඉදිකිරීම් 2015 නොවැම්බර් 30 දින වන විට අවසන් කරන ලෙසත් 2016 වර්ෂයේ මෙම ව්‍යාපෘති සඳහා ගෙවීම් කළ නොහැකි බවත් දන්වා තිබුණි. එම සියලු ව්‍යාපෘති එකම කොන්ත්‍රාත්කරුවකු වෙත ප්‍රදානය කර තිබුණත් කොන්ත්‍රාත්කරුට එම ව්‍යාපෘතිවල කාර්යයන් ඉටු කිරීමේ හැකියාව පිළිබඳ ඇගයීමක් කර නොතිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විටත් කළ වැඩවල ප්‍රගතිය කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 3.75 ක් හෙවත් රු.581,473 ක් වී තිබුණි.

## 3.9 අවිධිමත් ගනුදෙනු

දඹුල්ල ගලේවෙල ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන්, නාගරික සංවර්ධන ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම වෙත, 2014 සැප්තැම්බර් 25 දින රු.2,464,884 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණි. එම ව්‍යාපෘතිය ආරම්භ නොකිරීම නිසා මාස 17 ක කාලයක් මුළුල්ලේ එම අත්තිකාරම්

කොන්ත්‍රාත්කරුගේ අත රඳවා ගැනීමට ඉඩ හැර තිබිණි. 2016 ජනවාරි 17 දින කොන්ත්‍රාත්කරු විසින් එම අත්තිකාරම් චෙක්පතිකින් පියවා තිබුණි. නමුත් එම නිරවුල් කිරීම පොත්වල සටහන් කර ආදායමට ගැනීමට කටයුතු නොකර අදාළ චෙක්පත කොන්ත්‍රාත්කරුට යවා එම කොන්ත්‍රාත්කරු විසින් ක්‍රියාත්මක කරනු ලබන මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ බිල්පත්වලට එම එම චෙක්පත හිලව් කර තිබුණි.

**3.10 අනාර්ථික ගනුදෙනු**

--------------------

හඬවරන (Sound Proof) විදුලි ජනක යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ලංසු කැඳවා තිබුණු අතර ඒ වෙනුවට හඬවරන කාමරයක් තුළ සවි කරනු ලබන හඬවරන රහිත (Open type room sound proof) විදුලි ජනක යන්ත්‍රයක් රු. 12,129,876 කට මිලදී ගෙන තිබුණි. මිලදී ගෙන තිබුණු විදුලි ජනක යන්ත්‍රය ක්‍රියා කරන විට මහල් 04 කින් සමන්විත ගොඩනැගිල්ලේ කටයුතු කරගෙන යාමට අපහසු වන පරිදි ශබ්දයක් ඇතිවන බව නිරීක්ෂණය විය.

**3.11 මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 26 | 20 | 06 | - |
| (ii) | තෘතියික මට්ටම | 19 | 07 | 12 | - |
| (iii) | ද්විතියික මට්ටම | 81 | 71 | 11 | 01 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 76 | 68 | 08 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 05 | 07 | - | 02 |
| | **එකතුව** | **207** | **173** | **37** | **03** |